මැතිවරණ කොමිෂන් සභාව

මාධ්‍ය නිවේදනය

**COVID – 19 ආපදා තත්වයෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීමේදී දේශපාලනමය ප්‍රචාරනයන් ලබාගැනීමෙන් වැලකීමේ අවශ්‍යතාවය**

මෙයට පෙර කිසිදු අවස්ථාවක අපගේ රට මුහුණ නොදුන් COVID – 19 ආපදා තත්වය නිසා පිඩාවට පත් ජනතාවට සහන සැලසීමේ ක්‍රියාවලිය සඳහා දේශපාලනඥයන්, ආගමික නායකයින්, ව්‍යාපාරික ප්‍රජාව, සමාජ සේවකයින් හා දානපතින්ගේ දායකත්වය, මූල්‍යමය ආධාර හා අනෙකුත් උපකාර ලැබීම අතිශයින් අගය කළ යුතුය.

කෙසේ වුවත් මෙසේ ආධාර ලබාදෙන පාර්ශව අතරින් දේශපාලනඥයන් සුළු පිරිසක් මෙම ආධාර ලබාදීම පිළිබඳව ඡායාරූප ප්‍රසිද්ධ කරමින් ජනමාධ්‍ය හා සමාජ ජාල මගින් ප්‍රචාරණය සිදුකරමින් දේශපාලනමය වාසියක් ලබාගැනීමට කටයුතු කරන බවට නිරීක්ෂණය වී ඇත. මුළුමහත් සමාජයම ඉමහත් කැපවීමකින් COVID – 19 වසංගතය පරාජය කිරීමට සටන් කරන මොහොතක මෙවැනි ලාභ ප්‍රචාරණ ලබාගැනීමට කටයුතු කිරීම යෝග්‍ය නොවන බව මැතිවරණ කොමිෂන් සභාවේ මතයයි.

එබැවින් එවැනි දේශපාලන ප්‍රචාරන කටයුතු වලින් වැලකී COVID – 19 පරාජය කිරීමට සකලවිධ වාද භේද වලින් තොරව විශේෂයෙන්ම දේශපාලන ප්‍රවර්ධන වලින් තොරව සියලුම දෙනා ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරමු. එසේ කරන ලෙස සියලුම දෙනාගෙන් ඉල්ලා සිටිමු.

මහින්ද දේශප්‍රිය,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

2020 අප්‍රේල් මස 04 වැනි දින,
රාජගිරිය මැතිවරණ කොමිෂන් සභාවේදී ය.